# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 03/04/2024

පැය 1045

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.04.02 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 15 | 15 | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.04.02 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පමුණුගම පොලිස් වසමේ පමුනුගම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 59ක් හා කේරළ ගංජා ග්‍රෑම් 52 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පමුණුගම පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පමුණුගම පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. බලපත්‍ර නීති උල්ලංඝනය කරමින් නීති විරෝධිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ශාස්ත්‍රවෙල කඳවුර.**

2024.04.02 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ශාස්ත්‍රවෙල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පානම පොලිස් වසමේ පානම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍ර නීති උල්ලංඝනය කරමින් නීති විරෝධීව ට්‍රැක්ටර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පානම පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 34 පොතුවිල් ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ.

පානම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව හුණුගල් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුර.**

2024.04.02 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා නෙල්ලිඅඩි කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අච්චුවේලි පොලිස් වසමේ වාසවිලායි ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව හුණුගල් කැණීම් කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අච්චුවේලි පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 36 අච්චුවේලි ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ.

අච්චුවේලි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. නීති විරෝධීව තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සන්තකයේ තබා ගත් සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.04.02 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වලස්මුල්ල පොලිස් වසමේ වුලම්පිටිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **නීති විරෝධීව තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සන්තකයේ තබා ගත්** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වලස්මුල්ල පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 37 ඉපිපදෙනවිල, වලස්මුල්ල** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

වලස්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.04.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර නිලධාරීන්ට ලද තොරතුරක් මත වැල්ලවාය පොලිස් වසමේ ඇල්ලපාර ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 17 මිලි ග්‍රෑම් 950ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැල්ලවාය පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ ඌවකුඩාඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**වැල්ලවාය පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**